## වැඩ් හොඳටයි මං එහෙම කළේ !

එක් පිස්සෙක් පිස්සන් කොටුවේ නාන කාමරයේ බාත්ටබ් එකට වතුර පුරවා එහි ගිලී දිවිහානි කර ගැන්මට හදද්දී තවත් පිස්සෙක් විසින් ඔහු බේරාගත් බව අසා පිස්සන් කොටුවේ දොස්තරමහතා ඒ වීර පිස්සා තමා වෙත කැඳවීය.

" ඔබ කර ඇත්තේ ඇත්තටම ලොකු වීර ක්‍රියාවක්....ඔබේ මෙඩිකල් රිපෝට් මම පරීක්ෂා කළා.... ඒ අනුව බැලුවමත් මට ඔබේ කිසිම මානසික ආබාධයක් පේන්නෙ නෑ.... මම හිතන්නෙ ඔබට ගෙදර යන්න පුලුවන්... ඒ එක්කම මට කණගාටු ඒ ඔබ බේරගත් හාදයා ඊට ටිකකට පස්සෙ බාත්රූම් එකේම ලණුවකින් එල්ලිලා මැරිලා...."

එවිට වීරයා මෙසේ කීවේ ය.

" නෑ දොස්තර මහත්තෙයො මමයි මිනිහව ලණුවෙන් එල්ලුවෙ වතුර බේරෙන්න.....! "

## මේ මගේ නම

යාළුවන් තුන්දෙනෙක් හොඳටම බීමත්ව රැයේ ලන්ඩනයේ ප්‍රධාන වීදියක් දිගේ වැනෙමින් කෑගසමින් යද්දී පොලිස් කාර් එකක් ඔවුන් දෙසට පැමිණියේය. තමන් අත් අඩංගුවට ගනීවියයි සිතූන බැවින් බොරු නම් තුනක් දීමට ඔව්හු සිතූහ. ඒ සඳහා පාරේ ඇති සාප්පුවල නම් ඔවුන්ට මතක් විය.

" මොකක්ද නම ? "

පොලිස් නිලධාරියා එක් අයෙකුගෙන් ඇසුවේය.

" Mark Spencer " ඔහු කීය

දෙවැන්නාගෙන් නම ඇසූ කල ඔහු කීවේ John Lews කියාය.

තුන්වැන්නාගෙන්ද නම අසන ලදී. ඔහු පිළිතුරු දුන්නේ මෙසේය......

Kentucky Fried Chicken

**Double bed room to rent.**

10 minute walk to Burnt Oak Tube station. There is a wash basin in the bedroom itself, reasonable use of washing machine, internet and all bills inclusive.
**£ 115 per week**. Kitchen and bath room to share with the landlord. No other tenants. Parking for a car on the drive away. **Ideal for 2 students or a couple.**
15 minute bus ride to Middlesex University.
**Call 07944 393018 any time.**

**ලිහිණිය LIHINIYA**

**ශ්‍රීලංකා අවන්හල සහ වෙළඳසල**
***ප්‍රණීත ආහාර සැපයීමේ පුරෝගාමියෝ***
එවලේම පිළියෙල කරන ආප්ප, ඉඳිආප්ප
පිට්ටු, රොටි කොත්තු, බුරියානි
***උත්සව සඳහා ඇණවුම් බාරගනු ලැබේ.***
කුළුබඩු වර්ග ඇතුළු විවිධ ශ්‍රීලංකා නිශ්පාදන
*ලිහිණියා විශේෂ නිශ්පාදනයක් වන*
**බැදපු සහ අමු තුනපහ දැන් ඉතා ජනප්‍රියයි**

**Tel. 0208 450 9052**
**66 Cricklewood Broadway, London NW2 3EP**

**වසර ගණනාවක් පුරා ශ්‍රීලාංකික ජනතාවගේ හදවතට වඩාත් සමීපව කටයුතු කරන නැව් බඩු ආයතනයයි**

**සත්සමුදුර ජයගත් ට්‍රයිකෝ**

♦ ට්‍රයිකෝ - කොළඹ
50 සිරිල් සී පෙරේරා මාවත
කොළඹ 13
දුරකතනය 448270 / 432236

♦ ට්‍රයිකෝ - ගාල්ල ♦ ට්‍රයිකෝ - කුරුණෑගල

**සතියක් ඇර සතියක්, එනම් මසකට දෙවරක් ට්‍රයිකෝ නැව්බඩු ලංකාවට යැවේ. දින 17 කින් ඒවා ලංකාවට ළඟාවේ.**

**TRICO**
**Shipping & Forwarding Ltd**

**555 White Hart Lane**
**London N17 7RP**
**Telephone 0208 888 8787**
**Fax 0208 889 5445**
**E-Mail : trico@tricoshipping.com**
***නැව්බඩු සඳහා පූර්ණ විශ්වාසය තැබිය හැකි ආයතනය***



## නිදහසට හොඳ කරුණක්

බර්මිංහැම් යන මහා මාර්ගයේ රියැදුරෙක් ඉතා වේගයෙන් සිය රථය පදවාගෙන යමින් සිටින අතර පසුපසින් පොලිස් කාර් එකක් එන බව දුටුවේය. එම පොලිස් කාර් එකට ළං විය නොහැකි ලෙස රියැදුරා වඩා වේගයෙන් රථය එළෙව්වේය. එහෙත් පොලිස් හටයාද වැඩේ අතහැරියේ නැත. ඔහුද වේගයෙන් යන රථය පසුපස හඹා ගියේය. මෙසේ පැය භාගයක් පමණ කාර් දෙක රේස් යද්දී පොලීස් රථය පැරදවිය නොහැකි බව දත් රියැදුරා වේගය අඩුකොට රථය පාර අයිනේ නතර කළේය. ඒ පසුපසින් පොලිස් රථයද නැවැත්විණ. පොලිස් හටයා බැස අවුත් රියැදුරාට කතා කළේය.

" ඕයි අද මගේ දවසත් එච්චර හරි නෑ.... මට ඕන පුළුවන් ඉක්මනට ගෙදර යන්න.... මොකද මගේ දරුවොයි නෝනයි බලං ඉන්නවා.... හොඳයි තමුසෙට පුලුවන් නම් නිදහසට හොඳ කාරණයක් දෙන්න, ඇයි තමුසෙ පැයට හැතැප්ම 120 කටත් වැඩිය වේගෙන් කාර් එක එළෙව්වෙ කියලා,... මම තමුසෙට යන්න දෙනවා.... බොරු නෙවෙයි සත්තයි මම යන්න දෙනවා...."

රියැදුරා මඳක් කල්පනා කර මෙසේ කීවේය.

" ඔෆිසර්....! සුමාන දෙකකට ඉස්සර වෙලා මගේ ගෑනි පැනලා ගියා පොලිස්කාරයෙක් එක්ක... මම කාර් එකේ පසුපස බලන කණ්ණාඩියෙන් දැක්කම පොලිස් කාර් එකක් මගේ පස්සෙ පන්නනවා මම දැක්කෙ ඔෆිසර් ඒ පොලිස්කාරයා වගේ... මම හිතුවෙ ඒ පන්නන්නෙ මගේ ගෑනි ආපහු මට බාර-දෙන්නෙයි කියලා... ඒකයි මම ඇරලා ගියේ....!

## වෙන කවුරු දනීද?

මිනිසෙක් සිය බිරිඳගෙන් දික්කසාද වන්නට සිතා ඒ බව පල්ලියේ පාපොච්චාරණ වෙලාවේ දී පවුලේ හිතවතෙකු වූ පූජකවරයාට කීවේය. එවිට පූජක තැන මෙසේ පිළිතුරු දුන්නේය.

" මට හිතාගන්න අමාරුයි ඇයි එච්චර හොඳ බිරිඳකගෙන් ඔබ දික්කසාද වෙන්නෙ කියලා..... දැන් බලන්න ඇය බුද්ධිමත්... ගුණගරුක.... ඒවගේම ලස්සන... හරියටම ඔබේ උස මහතට ගැලපෙන සුන්දර කාන්තාවක්... ඉතින් ඇයි එහෙම තීරණයක් ගත්තෙ....?"

එවිට මිනිසා සිය කකුලෙන් සපත්තුවක් ගළවා අතටගෙන පූජකවරයාට පෙන්වමින් මෙසේ කීය. " බලන්න fපාදර් මේ සපත්තුව දිහා. මේකෙ හම ඉතාම මෘදුයි.ලස්සන දුඹුරු පාට. දිලිසෙන්න පොලිෂ් කරන්න පුළුවන්. කකුලට හරියට හරි. ලොකු ගණනකුත් වුනා....

ඒත් fපාදර් මේක දැම්මම කකුල කැපෙනවා... ඉන්න බෑ.... ඒක දන්නෙ මම විතරයි...! "

## මේ මගේ මුණුපුරාලා

වයසක ආච්චි කෙනෙක් පාක් එකේ සිය කුඩා මුණුබුරන් දෙදෙන සමග සෙල්ලම් කරමින් සිටියාය. ඇය හඳුනන තවත් වයසක කාන්තාවක් එතැනින් යද්දී මඳක් නැවතී සිනාසී මෙසේ ඇසුවාය.

" පුංචි මුණුපුරාලා දෙන්නත් එක්ක සෙල්ලම් කරනවා වගේ.... කීයද මේගොල්ලන්ගෙ වයස .....? "

එවිට ආච්චී මෙසේ කීවාය.

" දොස්තර මහත්තෙයට වයස අවුරුදු පහයි.... පෙරකදෝරු මහත්තෙයට තාම දෙකයි...."

***ලංකා විත්ති පුවත්පතේ පළවන ලිපි අදහස් හා දැන්වීම් ඒවා පළකරන අයගේය. ඒ පිළිබඳව කර්තෘගේ කිසිදු වගකීමක් නැත.***

***ලංකාවිත්ති පත්‍රය අවුරුද්දක් ඔබේ ගෙදරට ගෙන්වාගන්නට පවුම් 13 ක චෙක්පතක් Lanka Viththi යනුවෙන් ලියා පහත සඳහන් ලිපිනයට එවන්න.***

**Lanka Viththi**
**P. O. Box 64678,**
**London NW3 9LS**

# Hot dog eating contest
# හොට්ඩෝග් කෑමේ තරඟය

## The winner eats 68 hot-dogs
## ජයග්‍රාහකයා හොට්ඩෝග් 68 ක් කයි



මේ යකා මේ සේරම ටික කාලා තවත් කෑවා නේ !

He ate all these and more !





## කාන්තා අංශයේ ජයග්‍රාහිකාව 45 ක් කෑවාය
## Sonya- the winner of the women's section ate 45

**The Nathan's Hot Dog Eating Contest** is an annual American competitive-eating competition, which is run as a publicity gathering event. It is held each July 4 in **Coney Island**, a neighborhood of **Brooklyn, New York.** In 2011 over 40,000 spectators attended the event, and an additional 1.949 million viewers watched it live on ESPN television when **Joey Chestnut** ate **62** hot dogs and buns. This time he broke that- his own record by eating **68**. He won **$10,000** (£6,409) prize money.

**Sonya Thomas,** of Virginia won women's contest by eating 45 hot dogs and received the same prize money and championship belt.

නාදන් හොට්ඩෝග් කෑමේ තරඟය හැම වසරකම ජූලි 4 වන දින නිව් යෝක් හි කොනී දූපතේ පැවැත්වෙන ඉතා ජනප්‍රිය ශූරතාවකි. එය නරඹන්නට **40,000** ක් සෙනග රැස්වී ඇත. ඇමරිකානු රූපවාහිනියෙන් ඊට මහත් ප්‍රසිද්ධියක් දෙයි. මිලියන ගණනක් ජනතාව එය නරඹන්නේය.

මෙවර පිරිමි ජයග්‍රාහකයා ගියවසරේ ජයග්‍රාහකයාම වන ජෝ චෙස්නට් ය. ගිය වර ඔහු හොට්ඩෝග් 62 ක් කෑ අතර මේවර 68 ක් භක්ෂණය කළේය. ලැබුණු තෑගි මුදල ඇමරිකානු ඩොලර් **10,000** කි.

කාන්තා තරඟයද ඊට දෙවැනි නැත. හැට ගණනක කාන්තා සහභාගිත්වයෙන් මුල් තැනට ආවේ හොට්ඩෝග් **45** ක් කා පෙන්වූ වර්ජීනියා හි සොන්යා තෝමස්ය. ඇයටද ඩොලර් **10,000** ක මුදලක් ද ශූරතා පටියක් ද ප්‍රදානය කෙරිණ.

**SHANTHI & CO** ❋❋❋❋❋
**Solicitors & Commissioners for Oaths**

**We are an established law firm in North London**
Specialising in Immigration matters (Visas, **Tier 1** General - Highly Skilled Migrants / **Tier 2** Skilled Workers (WorkPermits), Students, Domestic Workers, Appeals - Judicial Reviews etc.)
- Residential / Commercial Conveyancing
- Landlord and Tenant Disputes ♦ Divorce ♦ Employment Law
- General Litigation (Sale of Goods, Services, Debts etc.)
- We offer comprehensive services on legal maters in Sri Lanka

***Contact:-* Shanthi Senadheera** (*Solicitor*) **Padmini Senadheera** (*Solicitor*) **Dinu Senadheera** (*Solicitor*)
**206 Seven Sisters Road, Finsbury Park, London N43NX**
**Tel. 020 7561 9494 Fax 020 7561 9495**
**Emergency: 07956 129 642 shanthi.co@btconnect.com**